



# පදක්කමකට ළඟින්ම ඉන්නේ බොක්සිං ක්‍රීඩකයෝයි

- ඩයන් ගෝමස්

**ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර පැවැත්වෙන පොදු රාජ්‍යය මණ්ඩලයීය ක්‍රීඩා උළෙල සඳහා සහභාගි වන ශ්‍රී ලංකා ක්‍රීඩක කණ්ඩායමට බොක්සිං ක්‍රීඩකයන් රැසක් ඇතුළත්ව සිටිනවා. ඒ ක්‍රීඩක පිරිස අතරින් බොක්සිං ක්‍රීඩකයන්ට තිබෙන්නේ ඉතා හොඳ පිළිගැනීමක් තරගාවලියට 'ඒ කාණ්ඩයෙන් සුදුසුකම් සැපිරූ ක්‍රීඩා ඉසව්වක් වන බොක්සිං ක්‍රීඩාව පිළිබඳව හා තරගාවලියේදී ශ්‍රී ලංකාව තබා ඇති බලාපොරොත්තු පිළිබඳව සාකච්ඡා කරන්නට අපි බොක්සිං සංගමයේ සභාපති හා මාස් සමූහ ව්‍යාපාරයේ කළමණාකාර අධ්‍යක්ෂ ඩයන් ගෝමස් මහතා මුණ ගැසුණා.**

*** පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙලට ඔබ සංගමයේ සූදානම ගැන මුලින්ම කතා කරමු.**

අපි ඉතා හොඳ පෙරහුරුවක් ලබා තිබෙන බව පැවසිය යුතුයි. කල්වේලා ඇතිව තරගාවලිය අරමුණු කරගෙන අපි තරග සැලසුම් සැකසුවා. අපේ කියුබානු පුහුණුකරු යටතේ ඉතා හොඳ පුහුණුවක් ලබා සිටිනවා. * ඔබ කලක සිට පවසන දෙයක් තමයි පොදු රාජ්‍ය මණ්ඩලයීය පදක්කමක් බොක්සිං ක්‍රීඩාවෙන් ශ්‍රී ලංකාවට දිනාදීම. පරිපාලන බලය බාර ගනිද්දීත් ඔබ එවැන්නක් ගැන සිහින මැවුවා. ඒ ගැන මොකද කියන්නේ?

ඔබ නිවැරදියි. මගේ විතරක් නොවෙයි අපේ බොක්සිං ක්‍රීඩාවට සම්බන්ධ බොහෝ දෙනෙක්ගේ අපේක්ෂාවත් අන්තර්ජාතික පදක්කම් දිනා ගැනීමයි. පසුගිය කාලයේ අපට පොදු රාජ්‍ය මණ්ඩලයීය බොක්සිං තරගාවලියේදී රිදී පදක්කමක් දිනා ගන්න හැකිවුණා. මෙවර ඕස්ට්‍රේලියාවේ පැවැත්වෙන පොදුරාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙලට යන බොක්සිං කණ්ඩායම පිළිබඳව ඉතා ඉහළ බලාපොරොත්තු තබන්න හැමෝම සූදානමින් සිටිනවා. මට කියන්න පුළුවන් වෙන්නෙ බොක්සිං ක්‍රීඩකයො පදක්කමකට ළඟින්ම ඉන්නා බවයි. කොහොම වුණත් එය තරගාවලියට සහභාගිවීමෙන් අනතුරුව තීරණය කළ හැකියි.

*** ඕස්ට්‍රේලියාව බලා යන ශ්‍රී ලංකා බොක්සිං කණ්ඩායමේ කළමණාකරුවා ඔබයි. ඕස්ට්‍රේලියාව වගේ රටකදී ක්‍රීඩකයන් අතුරුදහන්වීමට තිබෙන අවස්ථා බහුලයි. ඒ වගකීමට මුහුණදෙන්නෙ කොහොමද?**

මම ශ්‍රී ලංකාවේ විශාලම ආයතනයක කළමණාකාර අධ්‍යක්ෂකවරයෙක්. මා යටතේ 12,000 ක පමණ සේවක පිරිසක් සේවය කරනවා. ඔවුන් පාලනය කරන මට තරගාවලියට යන ක්‍රීඩකයන් කීපදෙනෙක් ආරක්ෂා කර ගන්න නොහැකියාවක් ඇත්තේ නැහැ. පළමු කාරණය විශ්වාසය. මට මගේ ක්‍රීඩකයන් විශ්වාසයි. ඒ වගේම ඔවුන් වැරදි තීරණවලට නොපෙළඹෙන ලෙස ආරක්ෂා කර ගන්න මට හැකියාවක් හා ඒ සඳහා සැලසුම් පවතිනවා.

*** අපේ බොක්සිං කණ්ඩායමෙන් ඇතැම් දක්ෂ ක්‍රීඩකයො කීපදෙනෙක් ඉවතට විසිවෙලා තිබෙනවා නේද?**

අපේ රටට පදක්කමක් දිනා ගන්න ඉතා සමීපව සිටි ක්‍රීඩකයන් දෙදෙනෙක්ට ඒ අවස්ථාව අහිමි වෙලා තිබෙනවා. එක් ක්‍රීඩකයෙක් නොදැනුවත්කම මත ලබාගත් ඖෂධයක් හේතුවෙන් තරග තහනමකටත් අනෙක් ක්‍රීඩකයා තේරීම් තරගයකදී පරාජය වීමෙනුත් පොදු රාජ්‍ය මණ්ඩලයීය තරගාවලියට නුසුදුස්සන් වී තිබෙනවා. පදක්කම් පිළිබඳව අපේක්ෂා තැබිය හැකි ඉතා දක්ෂ ක්‍රීඩකයන් කීපදෙනෙක් කණ්ඩායම තුළ ඉතිරිව සිටිනවා. ඒ වගේම ඔවුන් හැරුණු විට සෙසු ක්‍රීඩකයෝ මේ තරගාවලියෙන් ඉතා හොඳ අත්දැකීම් ලබා ගන්නා බවට මට විශ්වාසයි.

*** ඔබ නැවතත් බොක්සිං සම්මේලනයේ සභාපති ධූරයට පත්ව තිබෙනවා. අනෙක ඔබ තවමත් ක්ෂේත්‍රයේ කිසිවකුටත් එපා වූ චරිතයක් වී නැහැ. ක්‍රීඩකයන්ගේ සහය පුහුණුකරුවා වශයෙන් ක්‍රියා කරන්න පවා ඔබ නොමැලිව ඉදිරිපත් වෙනබව අපි දකිනවා. මෙය බොක්සිං සභාපතිවරයා වශයෙන් ඔබ කොහොමද කරන්නෙ?**

ඔබ ඔය අහන ප්‍රශ්නය අපේ රටේ බහුතරයකට තිබෙන ප්‍රශ්නයක්. මා යටතේ වැඩ කරන ක්‍රීඩකයෝ, මගේ පරිපාලනය යටතේ ක්‍රීඩා කරන ක්‍රීඩකයන්ගෙ 'ගම් ෂීල්ඩ්' එක අරං දාලා ඒක හෝදලා, වතුර පොවලා, ලේස් ගැට ගහන්න මගේ කකුල් නැවෙන එක බහුතරයකට ප්‍රශ්නයක්. නමුත් මා ඒ දේවල් කරන්නේ කවුරුවත් කියලාවත්, කාටවත් පේන්නවත් නොවෙයි. මම ඒවා කරන්නේ මගේ රට වෙනුවෙනුයි. ඒ වගේම ඒ ක්‍රීඩකයෝ මට මගේ සහෝදරයෝ, දරුවො වගෙයි. මගේ ළඟ බොරු මහන්තත්තකම් නැහැ. මිනිසුන් සරල විය යුතු බවත්, එකිනෙකාට උපාකර කරගත යුතු බවත් මා තරයේ විශ්වාස කරනවා.

*** බොක්සිං ක්‍රීඩාවට මුදල් ලබා ගැනීම ඉතාමත් අසීරුතා ඇති කරවන්නක් විය යුතුයි. නමුත් ඔබ ඔබේ පරිපාලනය යටතේ ඉතා පහසුවෙන් සංගමයේ ක්‍රියාකාරකම් පවත්වා ගෙන යනවා. මේ පිළිබඳව කිව හැක්කේ කුමක්ද?**

ඇත්තෙන්ම මම දන්නවා ක්‍රීඩාව පවත්වාගෙන යන්න මුදල් සොයා ගැනීම අසීරු බව. බොක්සිං සම්මේලනයේ තනතුරු බාර ගනිද්දීත් මට මේ බැරෑරුම් ප්‍රශ්නයට උත්තර සොයන්න සිදුව තිබුණා. නමුත් මා එයට සාර්ථකව මුහුණ දුන්නා. පෞද්ගලික ආයතනවලින් මට ඉතා හොඳ සැලකීමක් ලැබෙනවා. කළමණාකරණ ක්‍රියාකාරකම් පිළිබඳව මා දේශන පවත්වනවා. විවිධ ආයතනවල ආරාධනය පිට ඒ ආයතනවල කළමණාකරණ අංශයන්ට දේශන පවත්වද්දී මම මීට පෙර මුදල් අය කළේ නැහැ. නමුත් දැන් මා ඒ සඳහා මට ගෙවිය යුතු මුදල බොක්සිං සංගමයේ ගිණුමට බැර කරනවා. ඒ මගින් මම බොක්සිං පරිපාලනයට රුපියල් මිලියන දෙකකට අධික මුදල් ප්‍රමාණයක් සංගමයට සොයා දී තිබෙනවා. එවැනි හේතු නිසා මූල්‍ය අර්බුදවලට පිළියම් සොයා ගන්න අප සමත්ව සිටින බැව් කිව යුතුයි.

*** ඔබ සභාපතිධූරයෙන් ඉවත් වූ දිනක යළි බොක්සිං ක්‍රීඩාව අගාධයකට වැටේවි යැයි සැකයක් මිනිසුන් තුළ ගොඩනැගී තිබෙනවා. අනෙක මේ ආකාරයට පුද්ගලිකව උපයන මුදල් ක්‍රීඩාවට කැප කිරීමෙන් ඔබ අපේක්ෂා කරන්නේ මොකක්ද?**

බොක්සිං ක්‍රීඩාව තුළ මා සිටියත්, නොසිටියත් එයට සහය දක්වන්න පුද්ගලික අංශය දැන් සූදානම්. ඊළඟට මම මගේ හිතවත්, මා වෙනුවෙන් මුදල් ප්‍රදානය කරන පුද්ගලික ව්‍යවසායකයින් සමග සංගමයේ සෙසු නිලධාරීන් දැනුවත් කර හැඳුනුම්කම් ගොඩනගා තිබෙනවා. මා නැති වුණත් මේ ක්‍රීඩාවට ලැබෙන මුදල් ඒ සඳහා ලැබෙන බව මට විශ්වාසයි. මම මේ ක්‍රීඩාව වෙනුවෙන් මුදල් ලබාදීමෙන් අපේක්ෂා කරන්නේ බොක්සිං ක්‍රීඩාව වෙනුවෙන් හොඳ ජයග්‍රහණ මගේ රටට ලබාදීමයි. ඒ සඳහා කර ඇති වැඩකටයුතු වලට ලැබී ඇති ප්‍රතිචාර පිළිබඳව මා සතුටු වෙනවා.

චමින්ද සමන් කුමාර




## ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම නව ගිවිසුමකට

නව කොන්ත්‍රාත් පදනම යටතේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයන් සඳහා නව ගෙවීම් හඳුන්වා දෙන අතර එහිදී තරග ජයග්‍රහණය හා පරාජය වන ආකාරයට ඔවුන් සඳහා වන ගෙවීම්ද වෙනස් වනු ඇතැයි වාර්තාවේ. තරග ජයග්‍රහණය කරන අවස්ථාවලදී ගෙවීම් වැඩි කිරීමටත් තරග පරාජය වන අවස්ථාවලදී ගෙවීම් අඩු කිරීමටත් මෙම ගිවිසුම යටතේ තීරණය කෙරේ. ටෙස්ට් හා එක්දින ශ්‍රේණිගත කිරීම්වලදී පස්වැනි ස්ථානය දක්වා පැමිණෙන රටවල් පරාජය කිරීමේදී ක්‍රීඩකයන්ගේ ගෙවීම් වැඩි කිරීමටද මෙහිදී තීරණය කර තිබේ.

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයකුට ටෙස්ට් තරගයක් සඳහා සහභාගිත්වය වෙනුවෙන් රුපියල් 220000ක් ද, ජාත්‍යන්තර එක්දින තරගයක් සඳහා රුපියල් 135000ක් ද දැනට ගෙවනු ලබයි.

නව ගිවිසුමට එළඹීමේදී තරග පරාජයට පත්වන අවස්ථාවලදී මෙම ගෙවීම්වල අඩුවක් සිදුවන අතර එය පළමු වතාවට සිදුවන්නක් බවද වාර්තාවේ. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයන්ට දැනට වාර්ෂිකව ගෙවන කොන්ත්‍රාත් දීමනා මෙසේය.

- ඇමෙරිකානු ඩොලර් 60000 (රුපියල් ලක්‍ෂ හැට බැගින්) . මාවන් අතපත්තු, සනත් ජයසූරිය, කුමාර සංගක්කාර, චමින්ද වාස්, මුත්තයියා මුරලිදරන්, මහේල ජයවර්ධන
- ඇමෙරිකානු ඩොලර් 25000 (රුපියල් ලක්‍ෂ විසිපහ බැගින්) . තිලාන් සමරවීර, තිලකරත්න ඩිල්ෂාන් සහ උපුල් චන්දන.
- ඇමෙරිකානු ඩොලර් 15000 (රුපියල් ලක්‍ෂ පහළොව බැගින්) . රංගන හේරත්, ලසිත් මාලිංග, මාලිංග බණ්ඩාර, දිල්හාර ප්‍රනාන්දු, අලුතෙන් ඇතුලත්වන ක්‍රීඩකයන් . සංජීව වීරකෝන්, කෞෂල්‍ය ලොකුහපුආරච්චි සහ හසන්ත ප්‍රනාන්දු.

## රංගන - උදුම්බරා

### "රංගාභිෂේක නර්තන ප්‍රසංගය"

2002 වර්ෂයේ ජනාධිපති ශිෂ්‍යත්වලාභී රංගන - උදුම්බරා ඔස්ට්‍රේලියාවේ ඩීකින්, වික්ටෝරියා හා මැල්බර්න් විශ්ව විද්‍යාලයන්ට අනුයුක්ත වූයේ සිය පශ්චාත් උපාධි ලබා ගැනීම සඳහාය. ඔවුහු මැල්බර් නගරයට පැමිණ සති තුනකින් ශ්‍රී ලාංකීය ශාස්ත්‍රීය සම්ප්‍රදායික නර්තන විෂයය එහි ශ්‍රී ලාංකීය සිසු දැරිවියන්ට ඉගැන්වීම ආරම්භ කළහ. ප්‍රබල සජීවී තුන් අවුරුදු පුහුණු කාලපරාශයකට පසු, රංගන - උදුම්බරා අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා ප්‍රසාංගික කලා පදනම, ශ්‍රී ලාංකීය සංස්කෘතික හා ප්‍රජාසේවා පදනමේ සහාය ද ඇතිව ඉදිරිපත් කරන ප්‍රථම වෘත්තීය රංගාභිෂේක නර්තන ප්‍රසංගය, ඔස්ට්‍රේලියාවේ බැල්බර්න් හී මොනෑෂ් විශ්ව විද්‍යාලයීය ඇලෙක්සැන්ඩ්‍රා රඟහලේ දී :Alexandra Theater - Monash University) අප්‍රේල් මස 2 වැනි ඉරුදින සවස 6 ට පැවැත්වේ. ජාත්‍යන්තර කීර්තියට පත් ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ නර්තන වේදිනියක වූ කේමාවන් ද මෙම ප්‍රසංගයට ගෞරවණීය ලෙසින් සහභාගී වන්නීය.

ඩීකින් විශ්ව විද්‍යාලයෙන් (MBA) ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ලත් රංගන රත්නතුංග, වික්ටෝරියා විශ්ව විද්‍යාලයෙන් ·ිකප්* වෘත්තීය ගණකාධිකරණය පිළිබඳ පශ්චාත් උපාධිය ද ලබා ගත්තේය. ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් නීතිවේදී උපාධිය ලත් ඔහු, ශ්‍රී ලංකා පේරාදෙණි විශ්ව විද්‍යාලයෙන් (B.Sc.Hon) විද්‍යාවේදී ගෞරව උපාධිය ලබා, සම්ප්‍රදායික ලාංකීය ශාස්ත්‍රීය උඩරට නර්තනය, බෙර වාදනය හා ගායනයද ප්‍රගුණ කළ ශිල්පියකු වේ.

භරත නාට්‍ය විශාරද උදුම්බරා රත්නතුංග මැල්බර්න් විශ්ව විද්‍යාලයේ රංග වින්‍යාසය (Choreography) පිළිබඳ පශ්චාත් උපාධිධාරිනියක් වන අතර, රංග වින්‍යාසය පිළිබඳ ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබාගත් ප්‍රථම ලාංකීය නර්තන ශිල්පිනියද වන්නීය. ශ්‍රී ලංකා කැළණි සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ ලලිත කලා ගෞරව උපාධිධාරිණියක් වූ ඇය, කොළඹ විශ්ව විද්‍යාලයේ ප්‍රසාංගික අංශයේ බාහිර කථිකාචාර්ය ධූරයක් ද හෙබවූවාය. ඉන්දියානු භරත හා කතක් නර්තන උපාධිලාභී උදුම්බරා ශ්‍රී ලාංකීය ශාස්ත්‍රීය සම්ප්‍රදායික උඩරට, පහතරට හා සබරගමු වෘත්තීය නර්තන හා ගායන ශිල්පිනියක් ද වේ. ඇය භාත්කණ්ඩේ ලක්නව් සංගීත පීඨයේ සංගීතය පිළිබඳ ඩිප්ලෝමා උපාධිධාරිනියකි. රංගන රත්නතුංග ශ්‍රී ලංකාවේ ප්‍රකට නර්තන හා ජනගායනා ශිල්පිනියක හා එම විෂයයන් පිළිබඳ කථිකාචාර්ය වරියක වූ නන්දා හා රත්නතුංග යුවල ගේ දෙටුපුත් වූ අතර, උදුම්බරා ශ්‍රී ලංකාවේ 60 දශකයේ සිට අද දක්වා ප්‍රකට නාට්‍ය නිෂ්පාදකයකු, රචකයකු හා පරිවර්තකයෙකු වූ එස්. කරුණාරත්න හා සංගීත ගුරු උපදේශිකාවක වූ අනුලා කරුණාරත්න ගේ කණිටු දියණිය වේ.